සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2025 ජනවාරි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2025-02-08
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය : පැය 03 යි.***

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද පොත්වල **උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා** ලැයිස්තුව අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 “අස්තිත්වයක් අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් දක්වා එහි මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යන බව උපකල්පනය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලබයි.”

ඉහත ප්‍රකාශය මගින් විස්තර කරනු ලබන ගිණුම්කරණ සංකල්පය වනුයේ:

(1) අස්තිත්ව (Entity) සංකල්පයයි. (2) උපචිත (Accrual) සංකල්පයයි.

(3) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පයයි. (4) ප්‍රමාණාත්මක බවේ (Materiality) සංකල්පයයි.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාර අස්තිත්වයක ඇල්මැති පාර්ශවයක් / පාර්ශව තෝරන්න:

(1) සේවකයින්. (2) රජය.

(3) තරඟකරුවන්. (4) ඉහත සඳහන් සියල්ලම.

1.3 **රෝසි ට්‍රේඩර්ස්,** 2022 අප්‍රේල් 01 දින රු.6,000,000/- කට මෝටර් රථයක් අත්පත් කර ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ හීනවන ශේෂ ක්‍රමයට වාර්ෂිකව 25% ක අනුපාතිකයක් යටතේ මෝටර් රථ ක්ෂය කිරීමයි. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෝටර් රථයේ ක්ෂය අයකිරීම වූයේ:

(1) රු.1,500,000/-. (2) රු.1,125,000/-. (3) රු.1,434,375/-. (4) රු.2,625,000/-.

1.4 ඒකපුද්ගල ව්‍යාපාරයක් වන, **රාමා ට්‍රේඩර්ස්,** 2025 ජනවාරි 01 දින කාර්යාලයේ භාවිතය සඳහා රු.600,000/- ක් වටිනා කාර්යාල උපකරණයක් ණයට ගත්තේය. මෙම ගනුදෙනුව නිසා, ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම වන්නේ:

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම.

(2) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය වැඩිවීම.

(3) වත්කම් වැඩිවීම සහ වගකීම් අඩුවීම.

(4) වත්කම්වල සහ වගකීම්වල කිසිදු වෙනස්වීමක් සිදු නොවේ.

1.5 2025 ජනවාරි 31 දිනට, **XYZ ට්‍රේඩර්ස්** හි මුදල් පාලන ගිණුමේ පැවති හර ශේෂය රු.375,000/- ක් විය. නමුත්, එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ ශේෂය අතර වෙනසක් විය.

2025 ජනවාරි 30 දින තැන්පත් කළ රු.25,000/- ක චෙක්පතක් 2025 ජනවාරි 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණු බව සොයාගන්නා ලදී. තවද, 2025 ජනවාරි 30 දින නිකුත් කරන ලද රු.54,000/- ක චෙක්පතක් 2025 ජනවාරි 31 දින වන විටත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඉතිරිකිරීමේ ගිණුමේ පොලී ආදායම වූ රු.2,000/-, බැංකුව විසින් සෘජුවම බැංකු ගිණුමට බැර කර තිබූ නමුත්, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

ඉහත සඳහන් තොරතුරු අනුව, 2025 ජනවාරි 31 දිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ ශේෂය වූයේ:

(1) රු.344,000/-. (2) රු.406,000/-. (3) රු.348,000/-. (4) රු.402,000/-.

1.6 පහත සඳහන් තොරතුරු, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකපුද්ගල ව්‍යාපාරයක් වන සිල්වා ට්‍රේඩර්ස් හි, පොත්වලින් උපුටාගන්නා ලදී:

| | රු. |
|---|---:|
| 2023 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 1,500,000 |
| 2024 මාර්තු 31 දිනට වගකීම් | 900,000 |
| වර්ෂය තුළදී හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 500,000 |
| වර්ෂය තුළදී සිදුකළ ගැනිලි | 300,000 |
| 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 750,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2024 මාර්තු 31 දිනට සිල්වා ට්‍රේඩර්ස් හි මුළු වත්කම් වූයේ:

(1) රු.3,950,000/-. (2) රු.3,150,000/-. (3) රු.2,450,000/-. (4) රු.3,350,000/-.

1.7 "පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV) ] යන දෙකෙන් අඩු වටිනාකමට තොග, අගය කළ යුතුය."

ඉහත සඳහන් ප්‍රකාශය සඳහා අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි. (2) උපචිත සංකල්පයයි.

(3) ආරක්ෂණ (Prudence) සංකල්පයයි. (4) ගැළපුම් සංකල්පයයි.

1.8 රෝහිත් ස්ටෝර්ස් හි මාසික කාර්යාල කුලිය වූ රු.50,000/-, 2024 දෙසැම්බර් 31 දින ගෙවන ලදි. පහත සඳහන් ඒවා අතුරෙන්, මෙම ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට සිදුවන නිවැරදි බලපෑම තෝරන්න:

| | වත්කම් (රු.) | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| (1) | + 50,000 | = | - | + 50,000 |
| (2) | - 50,000 | = | - 50,000 | - |
| (3) | - | = | + 50,000 | - 50,000 |
| (4) | + 50,000 | = | + 50,000 | - |

1.9 පහත සඳහන් තොරතුරු, විවේක් ට්‍රේඩර්ස් හි පොත්වලින් 2025 ජනවාරි මාසය සඳහා උපුටා ගන්නා ලදි:

| | රු. |
|---|---|
| 2025 ජනවාරි 01 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය | 500,000 |
| 2025 ජනවාරි මාසය සඳහා විකුණුම් ජර්නලයේ එකතුව | 3,033,000 |
| 2025 ජනවාරි මාසය සඳහා ආපසු එවුම් ජර්නලයේ එකතුව | 250,000 |
| මාසය තුළදී ලියා හරින ලද බොල් ණය | 150,000 |
| මාසය තුළදී ණයගැතියන්ගෙන් ලැබුණු මුදල් | 2,745,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2025 ජනවාරි 31 දිනට වෙළෙඳ ලැබිය යුතු මුදල් (ණයගැති) පාලන ගිණුමේ ශේෂය වූයේ:

(1) රු.1,005,000/-. (2) රු.505,000/-. (3) රු.388,000/-. (4) රු.855,000/-.

1.10 2024 දෙසැම්බර් 31 දිනට, ZZ ට්‍රේඩර්ස් හි බැංකු ප්‍රකාශනයේ සඳහන් වූ වාසිදායක ශේෂය රු.22,000/- ක් වූ අතර, එදිනට මුදල් පාලන ගිණුමේ රු.20,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්වීය.

වෙනස සඳහා පහත සඳහන් හේතු සොයාගන්නා ලදි:

- දෙසැම්බර් මාසය සඳහා රු.1,500/- ක බැංකු ගාස්තු, මුදල් පොතේ සටහන් කර නොතිබුණි.
- ගනුදෙනුකරුවෙකු විසින් රු.25,000/- ක මුදලක්, සෘජුවම තැන්පත් කර තිබූ අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.
- රු.32,000/- ක මාසික ණය වාරිකය, බැංකුව විසින් හර කර තිබූ අතර, එය මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2024 දෙසැම්බර් 31 දිනට ගලපන ලද මුදල් පොතේ ශේෂය වූයේ:

(1) රු.31,500/-. (2) රු.15,000/-. (3) රු.37,000/-. (4) රු.11,500/-.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය සත්‍ය හෝ අසත්‍යදැයි දක්වන්න. සත්‍ය හෝ අසත්‍ය යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ACCPAC, පොදු ගිණුම්කරණ මෘදුකාංගයක් සඳහා උදාහරණයකි.

1.12 යම් කාල සීමාවක් තුළ ව්‍යාපාර අස්තිත්වයක මූල්‍ය කාර්යසාධනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මඟින් පෙන්නුම් කරයි.

1.13 බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් කරනු ලබන ශේෂය, සැම විටම වාසිදායක ශේෂයකි.

1.14 ගනුදෙනු සහ සිදුවීම්, ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුම් වේ.

1.15 අවංකභාවය (integrity), ගිණුම්කරණ ශිල්පියෙකු විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතියේ මූලධර්මයකි.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක්(02) සඳහන් කරන්න.

1.17 "ආදායම" යන පදය නිර්වචනය කරන්න.

1.18 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, උපචිත සංකල්පය භාවිත කරන්නේ කෙසේදැයි යන්නට උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

1.19 "අස්තිත්ව සංකල්පය" කෙටියෙන් පැහැදිලි කරන්න.

1.20 ABC ට්‍රේඩර්ස් හි පහත සඳහන් එක් එක් ගනුදෙනුව සටහන් කිරීම සඳහා යොදාගන්නා මූලාශ්‍ර ලියවිල්ල හඳුනා දක්වන්න:

(a) කාර්යාලයේ භාවිතය සඳහා **සීමාසහිත XYZ සමාගමෙන්** රු.1,000,000/- කට යන්ත්‍රයක් ණයට ගැනීම.

(b) රු.150,000/- ක් වටිනා භාණ්ඩ, ගනුදෙනුකරුවෙකුට ණයට විකිණීම.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **රෙහානි ට්‍රේඩර්ස්**, සිල්ලර වෙළෙඳසැලක් වන අතර, පහත සඳහන් ගනුදෙනු 2025 ජනවාරි මාසය සඳහා අදාළ වේ:

(1) නැවත විකිණීම සඳහා, රු.960,000/- ක් වටිනා භාණ්ඩ, ණයට මිලදී ගන්නා ලදී.

(2) රු.450,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු.600,000/- කට අත්පිට මුදලට විකුණන ලදී.

(3) රු.20,000/- ක මාසික කඩ කුලිය ගෙවන ලදී.

(4) වෙළෙඳ ණයහිමියෙකුට රු.200,000/- ක් ගෙවන ලදී.

(5) 2025 ජනවාරි 25 දින කල් පිරුණු ස්ථාවර තැන්පතුවකින් ලැබුණු පොලිය, රු.16,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට, ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මඟින් වන බලපෑම **සඳහන් කරන්න.**

*[තොගය + වෙළෙඳ ලැබිය යුතු මුදල් + මුදල් = ස්කන්ධය (ප්‍රාග්ධනය) + වගකීම්]* (ලකුණු 05)

(b) පහත සඳහන් ණයට විකුණුම් ගනුදෙනු, කේවලස්වාමී ව්‍යාපාරයක් වන රාධා ට්‍රේඩර්ස් හි 2024 මාර්තු මාසය තුළදී සිදු වූ ඒවා වේ:

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වෙළෙඳ වට්ටම |
|---|---|---|---|---|---|---|
| 2024.03.05 | 1256 | සීමාසහිත ABC සමාගම | පොත් (පිටු 80) | 1,200 | 65/- | 5% |
| 2024.03.10 | 1257 | PQ ට්‍රේඩර්ස් | A4 කඩදාසි බන්ඩල | 300 | 980/- | - |
| 2024.03.16 | 1258 | XYZ ට්‍රේඩර්ස් | CR පොත් (පිටු 120) | 200 | 240/- | 10% |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු මාසය සඳහා, රාධා ට්‍රේඩර්ස් හි ඉහත ගනුදෙනු සටහන් කිරීමට **විකුණුම් ජර්නලය පිළියෙල කරන්න**

(ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**ඇන් හාඩ්වෙයාර්,** 2024 ජනවාරි 01 දින ඇන් විසින් මුදලින් රු.4,500,000/- ක් මූලික ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් ආරම්භ කරන ලද කේවලස්වාමී ව්‍යාපාරයකි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුමේ (මුදල් පොත) සාරාංශය පහත දැක්වේ:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| ලැබීම් | හර (රු.) | ගෙවීම් | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 4,500,000 | අත්පිට ගැනුම් | 3,250,000 |
| අත්පිට විකුණුම් | 6,200,000 | වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3,150,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,500,000 | ගමනාගමන හා ප්‍රවාහන ගාස්තු | 450,000 |
| | | වැටුප් හා වේතන | 900,000 |
| | | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 80,000 |
| | | ලොරි රථයක් මිලට ගැනීම (2024 ඔක්තෝම්බර් 01 දින මිලට ගන්නා ලදී) | 2,000,000 |
| | | ගෙවූ කාර්යාල කුළී (මාසික කාර්යාල කුළිය රු.60,000/- කි) | 900,000 |
| | | විදුලි වියදම් | 280,000 |
| | | රක්ෂණය | 120,000 |
| | | ප/ගෙ ශේෂය | 2,070,000 |
| | 13,200,000 | | 13,200,000 |

(2) 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම් පොත්වල පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කර තිබේ:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 2,400,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 2,100,000 |
| ඉදිරියට කළ ගෙවීම් - කාර්යාල කුලී | 180,000 |
| ගෙවිය යුතු විදුලි වියදම් | 25,000 |

(3) මෝටර් වාහන, සරල මාර්ග ක්‍රමයට, පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතුය.

(4) 2024 දෙසැම්බර් 31 දිනට, තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 දෙසැම්බර් 31 දිනට, **ඈත් හාඩ්වෙයාර් හි ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**සෙනෙවි ඉන්ජිනියරින්**, වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදකයෙක් වන අතර, පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සෙනෙවි ඉන්ජිනියරින්** හි පොත්වලින් උපුටා ගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---|
| මිලට ගත් අමුද්‍රව්‍ය | 4,750,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 75,000 |
| සෘජු වේතන | 2,200,000 |
| වෙනත් සෘජු වියදම් | 210,000 |
| විදුලිය | 450,000 |
| කර්මාන්තශාලා කළමනාකරුගේ වැටුප | 1,200,000 |
| ආරක්ෂක ගාස්තු | 550,000 |
| කම්හල් රක්ෂණය | 80,000 |
| කුලිය | 720,000 |
| ක්ෂය - පිරියත හා යන්ත්‍ර | 220,000 |
| ක්ෂය - මොටර් ලොරි රථය | 240,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග, පහත පරිදි අගය කර ඇත:

| විස්තරය | 2023 අප්‍රේල් 01 දිනට (රු.) | 2024 මාර්තු 31 දිනට (රු.) |
|---|---|---|
| අමුද්‍රව්‍ය තොගය (පිරිවැයට) | - | 250,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 180,000 | 80,000 |

(2) නිමකරන ලද වානේ ගෘහ භාණ්ඩ, ගනුදෙනුකරුවන් වෙත ප්‍රවාහනය කිරීම සඳහා මෝටර් ලොරි රථය භාවිත කරනු ලබයි.

(3) පහත සඳහන් පරිදි වියදම් බෙදා වෙන්කළ යුතුය:

| වියදම් | කර්මාන්තශාලාව | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 75% | 25% |
| කුලිය | 75% | 25% |
| ආරක්ෂණ ගාස්තු | 80% | 20% |

(4) නිෂ්පාදනය කරන ලද භාණ්ඩ, නිෂ්පාදන පිරිවැය මත 15% ක ලාභයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, **සෙනෙවි ඉන්ජිනියරින්** හි නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**අශිනි ට්‍රේඩර්ස්, අශිනි** ට අයිතිව ඇති තේවලස්වාමි ව්‍යාපාරයකි. 2024 මාර්තු 31 දිනට ඇයගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස වූ රු.38,300/- අවිනිශ්චිත ගිණුමට බැර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරගන්නා ලදි. **අශිනි ට්‍රේඩර්ස්,** වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

වෙනස සඳහා පහත සඳහන් හේතු, පසුව හඳුනාගන්නා ලදි:

(1) රු.6,000/- ක කාර්යාල වියදමක්, මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

(2) 2024 මාර්තු මාසය සඳහා වූ රු.3,500/- ක ජල බිල්පත, ජල වියදම් ගිණුමේ රු.5,300/- ක් ලෙස සටහන් කර තිබුණි. අනෙක් සටහන නිවැරදිව වාර්තා කර තිබුණි.

(3) **අශිනි** ඇගේ පෞද්ගලික පරිහරණය සඳහා රු.2,500/- ක් ලබාගෙන තිබූ අතර, එය මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

(4) 2024 මාර්තු 31 දින, රු.250,000/- කට පරිගණකයක් මිලදී ගැනීම, කාර්යාල නඩත්තු ගිණුමේ සටහන් කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(5) 2024 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු රු.35,000/- ක ආරක්ෂක ගාස්තු බිල්පතක්, ලෙජර ගිණුම් දෙකෙහිම දෙවරක් සටහන් කර තිබුණි.

(6) විකුණුම් ජර්නලයේ එකතුව, රු.16,200/- කින් අඩුවෙන් සටහන් කර තිබුණි.

(7) රු.45,000/- ක අත්පිට විකිණීමක්, විකුණුම් ගිණුමේ සටහන් කර නොතිබුණි. නමුත්, එය නිවැරදිව මුදල් පොතේ සටහන් කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි, නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**ප්‍රවීන් ට්‍රේඩර්ස්, ප්‍රවීන්** ට අයිතිව ඇති කේවලස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2024 මාර්තු 31 දිනට **ප්‍රවීන් ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත පරිදි වේ:

**ප්‍රවීන් ට්‍රේඩර්ස්**

**2024 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ වටිනාකම - රු.6,000,000/-) | 10,000 | |
| කාර්යාල උපකරණ | 9,600 | |
| මෝටර් වාහන | 3,000 | |
| 2023 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 500 |
| කාර්යාල උපකරණ | | 4,400 |
| මෝටර් වාහන | | 750 |
| විකුණුම් | | 94,000 |
| ගැනුම් | 58,300 | |
| 2023 අප්‍රේල් 01 දිනට තොගය | 5,500 | |
| අතැති මුදල් | 120 | |
| බැංකු අයිරාව | | 1,500 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 6,400 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 8,000 |
| වැටුප් සහ වේතන | 15,700 | |
| කාර්යාල වියදම් | 150 | |
| ගෙවූ කාර්යාල කුලිය | 3,000 | |
| ජල වියදම් | 500 | |
| ආරක්ෂක ගාස්තු | 1,100 | |
| බැංකු අයිරා පොලිය | 450 | |
| විදුලි වියදම් | 1,250 | |
| විකුණුම් කොමිස් | 1,300 | |
| බැංකු ණය මුදල | | 1,000 |
| බැංකු ගාස්තු | 150 | |
| 2023 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන ගිණුම | | 6,370 |
| **එකතුව** | **116,520** | **116,520** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2024 මාර්තු 31 දිනට අවසාන තොගය, රු.7,250,000/- ක පිරිවැයට අගය කරන ලදී.

(2) 2024 මාර්තු මාසය සඳහා වන පහත සඳහන් වියදම්, ගිණුම් පොත්වල උපචිත කර නොමැත:

| | | |
|---|---|---|
| විදුලිය | : | රු.100,000/- |
| විකුණුම් කොමිස් | : | රු.150,000/- |

(3) කුලියට ගත් ගොඩනැගිල්ල මත, ගොඩනැගිල්ලේ හිමිකරුට ගෙවන ලද රු.600,000/- ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක්, ගෙවූ කාර්යාල කුලී ගිණුම තුළ ඇතුළත් වේ.

(4) 15% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ රු.1,000,000/- ක බැංකු ණයක් 2024 මාර්තු 01 දින ලබාගෙන තිබේ. ණය ආපසු ගෙවීම, 2024 අප්‍රේල් 01 දින සිට ආරම්භ කළ යුතු අතර, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගෙවිය යුතු පොලිය, ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(5) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | : | වර්ෂයකට 05% බැගින් |
| කාර්යාල උපකරණ | : | වර්ෂයකට 20% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |

(6) ගනුදෙනුකරුවෙක් බුන්වත්භාවයට පත්වීම නිසා රු.100,000/- ක මුදලක්, බොල් ණය ලෙස ලියා හැරීමටත්, 2024 මාර්තු 31 දිනට ඉතිරි වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 5% ක ප්‍රතිපාදනයක් සිදුකිරීමටත් **ප්‍රවීන්** තීරණය කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තිරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරික්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරික්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරික්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තිරණය කිරීම පිණිස විස්තරාත්මකව පරික්ෂා කරන්න. |